# කුරුලු බබාලට වඳුරු යාළුවෙක්



කේ. එම්. යුමල්යා ලිනාදි කුලතුංග

# කුරුලු බබාලට වඳුරු යාළුවෙක්

කේ. එම්. යුමල්යා ලිනාදි කුලතුංග

**පළමු දිගහැරීම**

මහාමායා බාලිකා විද්‍යාලය

2 වසර D

2026 මැයි 10

ISBN 978-624-211-086-8

# පිදුම

මට අකුරු සහ ජීවිතයේ මුල් පාඩම් ආදරයෙන් ඉවසීමෙන් ඉගැන්වූ

පළමු සහ දෙවන වසර පන්තිභාර

ඩබ්ලිව්. එම්. කේ. ජී. වාසනා කුමාරි විජේකෝන්

ගුරු මැණියන්ට ඉතාමත් ගෞරවයෙන් සහ කෘතඥව

මෙම කතන්දර පොත

පුද කර සිටිමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොතේ ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන්ට මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර,
විදුහල්පතිනිය,
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,  
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.  
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.  
2026-05-10

# <u>සුභාශිංසන පණිවුඩය</u>

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026-05-10

එකෝමත් එක කාලයක පලතුරු ගස් ගොඩාක් තියෙන කැලෑවක් තිබුණා. ඒ කැලේ අඹ ගසක කුරුළු පවුලක් හිටියා. කුරුළු අම්මයි තාත්තයි කුරුලු බබාලා දෙන්නයි. එයාලට ලස්සන කුරුලු කූඩුවක් තිබුණා.



හැමදාම උදේට කුරුළු අම්මයි තාත්තයි බබාලට කෑම හොයන්න යනවා. දවසක් කුරුළු බබාලට පරිස්සමින් ඉන්න කියලා කෑම හොයන්න ගියා. එදා අහසත් කළු කරලයි තිබුණේ.



ටික වේලාවකින් වැස්ස වහින්න පටන් ගත්තා. අහසත් ගොරවන්න ගත්තා. චූටි පැටව් දෙන්නා බය වෙලා අඬන්න පටන් ගත්තා. කුරුළු බබාලට අම්මා මතක් වුණා. කුරුළු කූඩුවත් තෙමෙන්න පටන් ගත්තා. එයාලට තාම ඉගිළෙන්නත් බෑ.



වැස්සෙන් තෙමෙන හින්දා කැලෑවේ හැම සතෙක්ම හෙවනක් හොයන් ගියා. කැලෑවේ හිටපු වඳුරු පැංචෙක් වැස්සෙන් බේරෙන්න ගහෙන් ගහට පැන පැන යද්දි අඬ අඬ ඉන්න කුරුළු පැටව් දෙන්නා දැක්කා. වඳුරු පැංචට දුක හිතුනා.



වඳුරු පැංචා ඉක්මනට කුරුලු පැංචලා ළඟට ආවා. “ඔයාලා අඬන්න එපා. ඔයාලගේ අම්මා එනකම් මම ඔයාලා එක්ක ඉන්නම්කෝ” වඳුරු පැංචා කිව්වා.



වඳුරු පැංචා ගස්වල කොළ කඩන් ඇවිත් කුරුළු කූඩුව වැහුවා. දැන් කුරුලු පැංචලා තෙමෙන්නේ නෑ. කුරුලු පැටව් අඬන එකත් නතර කළා.



වඳුරු පැංචා චූටි පැටවුන්ට කෙසෙල් ගෙඩිත් ගෙනත් දුන්නා. චූටි පැටවුන්ට ටිකෙන් ටික බයත් නැති වුණා. වඳුරු පැංචත් එක්ක යාළු වුණා. කෙසෙල් ගෙඩිත් චුට්ට චුට්ට කෑවා.



ඊට පස්සේ වැස්ස ටිකක් නතර වුණා. කුරුළු අම්මයි තාත්තයි ඇතින් එනවා චුටි පැටව් දැක්කා. එයාලට හරිම සතුටුයි.



චුටි පැටව් පරිස්සමට ඉන්නවා දැකලා අම්මටත් තාත්තාටත් හරිම සතුටුයි. චුටි පැටව් අම්මට වඳුරු පැංච ව එයාලව ආදරෙන් බලා ගත්ත විදිහ කිව්වා. වඳුරු පැංචට චුටි පැටව් බලා ගත්තට ගොඩාක් ස්තූති කළා.



ඊට පස්සේ වඳුරු පැංචා හැමදාම කුරුලු අම්මයි තාත්තයි කෑම හොයන්න ගියාම චුටි පැටවුන් බලන්න ආවා.



කුරුළු බබාලා ටිකෙන් ටික ලොකු වුණා. ඒත් එයාලට උදව් කරපු වඳුරු පැංච ව කවදාවත් අමතක කළේ නෑ. එයාලා හැමදාම හොඳම යාළුවෝ වගේ හිටියා.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

IBSN 978-624-211-086-8